රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2024.11.08

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ

අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු

වෙබ් අඩවි කර්තෘ

**<u>පාසල් අධ්‍යාපන කටයුතු සහ සන්නිවේදනය සඳහා "සමාජ සන්නිවේදන යෙදවුම්" භාවිතා කිරීම</u>**

උක්ත කරුණු සම්බන්ධයෙන් අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්, ජේ.එම්.ටී. ජයසුන්දර මහත්මිය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයේ පිටපතක් සුදුසු පරිදි ප්‍රචාරය සඳහා මේ සමග එවමි.

**එච්.එස්.කේ.ජේ. බණ්ඩාර**

**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.

දු. தொ. T - (+94 11) 2515759
ෆැ. பெ. F - (+94 11) 2514753
ඊ. மி. E - dg@dgi.gov.lk

www.dgi.gov.lk
www.news.lk

අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය
கல்வி, விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சு
Ministry of Education, Science and Technology
Isurupaya, Battaramulla, Sri Lanka.
www.moe.gov.lk


මගේ අංකය / எனது இல / My Ref. ED/09/12/12/07/16
ඔබේ අංකය / உமது இல / Your Ref.
දිනය / திகதி / Date 2024.11. 08

චක්‍රලේඛ අංක : 33/2024

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පරිවේණාධිපති හිමිවරුන්
සියලු ම විදුහල්පතිවරුන්

**<u>පාසල් අධ්‍යාපන කටයුතු සහ සන්නිවේදනය සඳහා "සමාජ සන්නිවේදන යෙදවුම්" භාවිත කිරීම</u>**

කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ පාසල් සිසුන්ට අතපසු වූ අධ්‍යාපන අවස්ථා ආවරණය කිරීමට වට්ස්ඇප් (Whatsapp), වයිබර් (Viber), ටෙලිග්‍රෑම් (Telegram) වැනි සමාජ සන්නිවේදන යෙදවුම් භාවිතා කරමින් පාසල් පද්ධතියෙහි සන්නිවේදන කටයුතු සිදු කරන ලදි. මේ වන විටත් පාසල් පද්ධතිය තුළ එම සන්නිවේදන යෙදවුම් ඔස්සේ සිසුන් සහ දෙමාපියන් වෙත අතිරේක ඉගෙනුම් ආධාරක ලබා දීම, විෂය සටහන් හුවමාරුව, සන්නිවේදනය යනාදි කාර්යයන් ක්‍රියාත්මක වේ.

02. පාසල් අධ්‍යාපන කටයුතු සඳහා ඉහත සමාජ සන්නිවේදන යෙදවුම් භාවිත කිරීම හේතුවෙන් සිදුවන අහිතකර බලපෑම් පිළිබඳව මෙම අමාත්‍යාංශයට තොරතුරු වාර්තා වෙමින් පවතී. එබැවින් සන්නිවේදන යෙදවුම් භාවිතයේ දී පහත උපදෙස් පරිදි කටයුතු කරන ලෙස සියලුම ගුරුවරුන් හා අදාළ පාර්ශ්වයන් දැනුවත් කරන ලෙස අවධාරණය කරමි.

I. පාසල් ප්‍රධානීන්/නියෝජ්‍ය විදුහල්පති/සහකාර විදුහල්පති/අංශ ප්‍රධාන ගුරුවරුන් අදාළ සන්නිවේදන සමූහයේ (Whatsapp වැනි) පරිපාලක (Admin) ලෙස කටයුතු කරමින් නිරන්තර අධීක්ෂණය හා නියාමනය යටතේ ගුණාත්මක මට්ටමින් සන්නිවේදන සමූහය පවත්වාගෙන යා යුතුය.

II. අධ්‍යාපන කටයුතු සඳහා වෙන්කර ඇති පාසල් කාලය උපරිම ලෙස ප්‍රයෝජනයට ගෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සජීවීව සිදු කිරීමෙන් විෂය නිර්දේශය ආවරණය කිරීමට කටයුතු කල යුතු අතර විෂය නිර්දේශ ආවරණය සඳහා සන්නිවේදන සමූහ භාවිතයෙන් වැළකිය යුතුය.

III. අධ්‍යාපන කටයුතු සඳහා සන්නිවේදන යෙදවුම් භාවිත කරන්නේ නම්, සුහුරු තාක්ෂණික උපකරණ පහසුකම් නොමැති දරුවන් අපහසුතාවයට පත් නොවන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු වන බව සහතික කරගැනීම සඳහා සුවිශේෂී ක්‍රමවේද අනුගමනය කළ යුතුය.

IV. විශේෂයෙන් ප්‍රාථමික අංශයේ සිසු දරුවන් විසින් පාසලට රැගෙන ආ යුතු ඉගෙනුම් ද්‍රව්‍ය/උපකරණ ආදිය පිළිබඳව දැනුම් දීමේදී විධිමත් සැලැස්මකින් යුතුව ප්‍රමාණවත් කාලයක් ලබා දී දෙමාපියන් දැනුවත් කිරීම කළ යුතුය. ඒ පිළිබඳව සිහිකැඳවීම් යොමු කිරීම සඳහා පමණක් සන්නිවේදන යෙදවුම් භාවිතය සීමා කිරීම සුදුසු වේ.

V. සිසුන් විසින් නිවසේ දී සිදු කල යුතු අභ්‍යාස හා පැවරුම් ආදිය සිසුන්ට ලබා දීම පාසල් පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර පැහැදිලි කිරීමෙන් පමණක් සිදුකල යුතු අතර දෙමාපියන් සහ පවුලේ අනෙක් සාමාජිකයින්ද අපහසුතාවයට පත් කරමින් ඉහත සන්නිවේදන යෙදවුම් මේ සඳහා යොදා නොගත යුතු බව තරයේ අවධාරණය කරමි.

VI. පොදුවේ සලකන කල්හි මෙවැනි සන්නිවේදන යෙදවුම් භාවිතයේදී කිසිදු අයුරකින් සිසුන්ගේ පෞද්ගලිකත්වයට හානි වන සහ ඔවුන් මානසික පීඩනයට ලක්විය හැකි ආකාරයේ පණිවුඩ, වීඩියෝපට, ඡායාරූප, හඬපට, නිවේදන ආදී කිසිවක් යොමු කිරීම සිදු නොකළ යුතු අතර එවැනි සිදුවීම් වාර්තා වුවහොත් ඒ සම්බන්ධව විනයානුකූලව දැඩි පියවර ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි.

VII. රාජකාරිමය වශයෙන් සහ අධ්‍යාපන සංවර්ධනයට අදාළ වන ආකාරයේ සන්නිවේදන යෙදවුම් සමූහයන්වලට අමතරව අවිධිමත් ලෙස පාසල් ප්‍රජාව හා ගුරුවරුන් සම්බන්ධ කර ගනිමින් පවත්වාගෙන යනු ලබන සන්නිවේදන යෙදවුම් සමූහ මගින් පාසලේ කීර්තිනාමයට හෝ පාසල් ප්‍රජාවට සහ සිසු දරුවන්ට විය හැකි හානි සම්බන්ධව අදාළ සමූහයන්හි පරිපාලකයින් විසින් පූර්ණ වගකීම දැරිය යුතු වේ. ඒ හා සම්බන්ධයෙන් මතුවන ගැටළුවලදී රටේ පවතින පොදු නීතිය සහ තොරතුරු සන්නිවේදන පනත අනුව නීතිමය පියවර ගනු ලබන බව ද දන්වමි.

ජේ. එම්. තිලකා ජයසුන්දර
ලේකම්

පිටපත් :-

1. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
2. විගණකාධිපති
3. විභාග කොමසාරිස් ජනරාල්
4. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්
5. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම ශාඛා ප්‍රධානීන්